ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** : **සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**

**දිනය** : **20.08.2018**

## සේවක අර්ථසාධක අරමුදල විසින් වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගමේ ආයෝජනය සම්බන්ධයෙන් කෙරෙන පැහැදිලි කිරීමයි

වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගමේ මව් සමාගම වන ඊස්ට් වෙස්ට් ප්‍රොපර්ටීස් සමාගම විසින් කොළඹ කොටස් වෙළඳපොළ වෙත ඉදිරිපත් කරන ලද සාංගමික හෙළිදරව් කිරීමක් සහ ඒ පිළිබඳව ඇතැම් මාධ්‍යවල පලවූ වාර්තා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමුවී තිබේ.

වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගමේ කොටස්, එච්පීඑල් ප්‍රොපර්ටීස් ගෲප් ආයතනය වෙත විකිණීමට අදහස් කරන බව 2018 ජූනි මාසයේදී වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගමේ සභාපති විසින්, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. ඉන් පසුව, මේ සම්බන්ධව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගම සමඟ සාකච්ඡා ගණනාවක් සිදුකරන ලදී. ඒ අනුව වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් සමාගමේ සිදුකර ඇති කොටස් ආයෝජනයෙහි තක්සේරුවක් ලබාගැනීමට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර ඇති අතර තක්සේරු ක්‍රියාවලිය මේ වන විට සිදුවෙමින් පවතී.

සේවක අර්ථසාධක අරමුදල සිය සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභයක් ලබා දීම සඳහා එකී ආයෝජනයෙන් ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අරමුදලට ලැබීම සහතික කරනු පිණිස, වැලිගම හොටේල් ප්‍රොපර්ටීස් ලිමිටඩ් හි සිදුකර ඇති ආයෝජනයෙන් ඉවත් වීමට පෙර, එහි වටිනාකම තීරණය කිරීම සඳහා පුළුල් අධ්‍යයනයකින් ලබාගන්නා තක්සේරුවක් අත්‍යවශ්‍ය වේ. එබැවින්, සේවක අර්ථසාධක අරමුදල මෙම ආයෝජනයෙහි තක්සේරුවක් ලබාගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇති බව අවධාරණය කිරීමට කැමැත්තෙමු.